# වාර්ෂික වාර්තාව

# 2012



**උද්භිද උද්‍යාන භාර අරමුදල**

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

**පේරාදෙනිය**

# ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2012 (Annual Report – 2012)

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 1995-12-15 දිනැති සංදේශය සලකා බලා 1996-02-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලට ආදායම වශයෙන් නාමිකව බැර කරනු ලැබේ. මේ සඳහා සෑම වර්ෂයකම භාණ්ඩාගාර අනුමත ඇස්තමේන්තුවේ 2201 වැය විෂය (ප්‍රාග්ධන මාරු) යටතේ ප්‍රතිපාදන වෙන්කර දී ඇත. අරමුදලේ වියදම් දැරීමට අවශ්‍ය මුදල්, අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රිම මුදලින් ලබාගෙන වර්ෂය අවසානයේ පියවීම් කරනු ලැබේ. ඊට අමතරව අරමුදලේ ආදායම වැඩිකර ගැනිම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනිමට ද ඉඩකඩ සලසා ඇත.

මෙම අරමුදල භාරකාර මණ්ඩලයකින් පාලනය වන අතර, එම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ද , භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ද, භාරකාර මණ්ඩලයේ සාමාජික වශයෙන් මහා භාණ්ඩාගාරයේ අය - වැය අධ්‍යක්ෂ ද කටයුතු කරනු ලැබේ.

### උද්භිද උද්‍යාන භාර අරමුදල

1. අරමුදලේ නම : ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල
2. ස්වභාවය : උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මූල්‍ය සහාය ලබාදීම
3. අදාල චක්‍රලේඛයන් : I) අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව

   II) ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය.
4. ආරම්භ කළ දිනය : 1996 දෙසැම්බර් 20
5. කාර්යාලය : පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය
6. බැංකුව : පේරාදෙණිය ලංකා බැංකුවේ ගිණුම් අංක 0007040848

7. **අරමුදලේ පරමාර්ථ:**

අ) ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තවදුරටත් යහපත් කිරීමේ ක්‍රියා මාර්ග ගැනිම.

ආ) පාරිසරික අධ්‍යාපනික හා ශාක පිළිබඳව දැනට පවත්නා සංරක්ෂණය සම්බන්ධයෙන් අර්ථාන්විත වැඩ සටහන් ක්‍රියාත්මක කොට දියත් කිරීම.

ඇ) උද්භිද උද්‍යානයන්හි සේවා නියුක්ත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩි දියුණු කිරිම මෙන්ම අදාල කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනිමට මුල්‍යාමය ආධාර සැපයිම.

ඈ) ශාක එකතුව පිළිබඳව ද වර්ධනාත්මක වැඩ පිළිවෙලක් ඇති කිරීම.

ඉ) උද්භිද උද්‍යානයන්හි ප්‍රයෝජනය සඳහා පාරිසරික අධ්‍යාපනික සංරක්ෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කාර්මික ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරකම් වර්ධනය කිරීම හා ඊට ආධාර කිරීම.

ඊ) විද්‍යාඥයින්ට හා උද්භිද උද්‍යානයට පැමිණෙන අයට අවශ්‍ය පහසුකම් සැපයිම සඳහා අවශ්‍ය ඕනෑම හදිසි ඉදි කිරිමේ කටයුත්තක් භාර ගැනිම.

උ) අවශ්‍ය අවස්ථාවන්හිදී පුනරාවර්තන ප්‍රතිපාදන වල ඌණතාවයන් ඌණපූරණය කිරීම.

## 2012 වර්ෂයේ අරමුදලේ මුදල් ප්‍රගතිය

| | | |
|---|---|---|
| 2012-01-01 දිනට බැර ශේෂය | = | රු. 59,918,097.43 |
| **එකතු කළා:** | | |
| 2012 වර්ෂයේ ආදායම (බැර කිරීම්) | = | රු. 92,034,488.69 |
| | | ------------------ |
| | | රු. 151,952,586.12 |
| **අඩු කළා :** | | |
| 2012 වර්ෂයේ වියදම් (හර කිරීම්) | = | රු. 89,237,194.52 |
| | | ----------------- |
| 2012.12.31 දිනට භාණ්ඩාගාර ශේෂය | = | **රු. 62,715,391.60** |

* (මෙම ශේෂය නාමික ශේෂයක් පමනි)

# අරමුදලේ ප්‍රතිපාදනය යොදා ගනිමින් 2012 වර්ෂයේ ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්

- ❖ උද්භිද උද්‍යාන අලංකරණය සඳහා පුනරාවර්තන වියදම් ප්‍රමාණවත් නොවූ හෙයින් අරමුදල යටතේ ප්‍රතිපාදන සලසමින් උද්‍යාන ඉතා දර්ශනීය මට්ටමකින් වර්ෂය තුල පවත්වා ගෙන යන ලදී.



පේරාදෙණිය උද්භිද උද්‍යානයේ දර්ශනයක්

- ❖ උද්භිද උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ සේවයේ නියුතු උද්භිද උද්‍යානවල විවිධමට්ටමේ තනතුරුවල සේවකයින් පුහුණු කිරීම, නිළ ඇඳුම් ලබා දීම, මල් පැළ, බීජ රෝපණ ද්‍රව්‍යය සහ පුස්තකාල පොත් දේශිය හා විදේශිය වෙළඳපලින් ලබා ගැනිම සිදු කර ඇත.




හක්ගල උද්භිද උද්‍යානයේ දර්ශනයක්

- ❖ විවිධ ස්වභාවික හා පාරිසරික හේතුන් නිසා කාලයක් තිස්සේ අබලන්ව පැවති **පේරාදෙණිය** රාජකීය උද්භිද උද්‍යානයේ ප්‍රධාන මාර්ග කි.මී. 1.427 දුර ප්‍රමානයක් කාපට් අතුරා ඉතා හොඳ



පේරාදෙණිය උද්භිද උද්‍යානයේ කුළුබඩු උයනෙහි ඉන්ටර්ලොක් ගල් අතුරා ඇති අයුරු

මට්ටමකින් අලුත්වැඩියාව සිදුකරන ලද අතර, උද්‍යානයේ අත්‍යාවශ්‍ය ස්ථාන “ඉන්ටර්ලොක්ස්” අතුරා සංවර්ධනය කර ඇත.



පේරාදෙණිය උද්භිද උද්යානයේ ප්‍රධාන මාර්ග කාපට් කිරීම

❖ **පේරාදෙණිය** රාජකීය උද්භිද උද්‍යානයේ කම්කරු නිවාසයන්හි අංක 02 කම්කරු නිවාස ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම. මේ තුළින් කම්කරු සේවක නිවාස පහසුකම් වැඩි දියුණු කරන ලදි.



පේරාදෙණිය උද්භිද උද්‍යානයේ සේවක වැඩ බිම් කාර්යාල ගොඩනැගිල්ල

❖ **පේරාදෙණිය** රාජකීය උද්භිද උද්‍යානයේ කටයුතු වඩා කාර්යක්ෂම අයුරින් සිදු කිරීමට උපකාරි වන පරිදි උද්‍යානයේ සේවක වැඩ බිම් කාර්යාල පහසුකම් වැඩි දියුණු කරන ලදි. මෙහිදි වඩුවැඩපල, කම්හල, ජලනල අලුත්වැඩියාව සිදු කරන වැඩපල, ක්ෂේත්‍ර කාර්යාල එක් ගොඩනැගිල්ලකට ගොනු කිරීම සඳහා සේවක වැඩ බිම් නිවාසයක් ඉදි කිරීම ආරම්භ කරන ලදි.



පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ඇන්තුරියම් තවානේ පුහුණු පන්ති කාමර අලුත්වැඩියාව

❖ **පේරාදෙණිය** රාජකීය උද්භිද උද්‍යානයේ ඇන්තුරියම් තවානේ පුහුණු පන්ති කාමර වැඩි දියුණු කිරීම තුලින් පුහුණුවන්නන්ට වැඩි පහසුකම් සලසා ඇත.

❖ ශ්‍රී ලංකා හඳබිම අධිකාරියට අයත් රාජකීය උද්භිද උද්‍යාන තුළ තිබූ අංක 1098 දරණ ගොඩනැගිල්ල ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට පවරා ගැනීම.



ගම්පහ උද්භිද උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම

❖ **ගම්පහ** උද්භිද උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග මීටර් 750 ක් බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කාපට් කිරීම.



ශාක ගවේෂණ කටයුතු සිදු කරමින්

❖ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ උද්භිද විද්‍යාත්මක පර්යේෂණ කටයුතු සඳහා අරමුදලින් ප්‍රතිපාදන සලසා ඇත. මේ යටතේ දුර්ලභ ශාක එකතු කිරීම, ශාක ගවේෂණ කටයුතු සිදු කිරීම ද, පර්යේෂණ / වැඩමුළු සඳහා විද්‍යාත්මක උපකරණ මිලදී ගැනිම ද සිදු කර ඇත.

❖ **හක්ගල** උද්භිද උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග මීටර් 2.083 ක් මධ්‍යම පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කාපට් කිරීම සහ පටු මාවත් “ ඉන්ටර්ලොක්ස් ” අතුරා සංවර්ධනය කර ඇත.



ජාතික ශාකාගාරයේදී ප්‍රථම වරට පවත්වන ලද පහත් ශාක ( Bryology) පිළිබඳව ජාතික වැඩමුළුවේ ප්‍රායෝගික අධ්‍යයන අවස්ථාවක්

❖ උද්භිද උද්‍යාවල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා නවීන තාක්ෂණික උපකරණ මිලදී ගැනිම සිදු කර ඇත.

❖ මල් වගාකරුවන් සහ පුහුණුවන්නන් සඳහා ප්‍රයෝජනයට ගැනීම සඳහා අලෙවිය පිණිස මල්වගා උපදෙස් පොත් 3500 ක් මුද්‍රණය කර ඇත.



හක්ගල උද්භිද උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම



මුද්‍රණය කෙරු මල්වගා උපදෙස් පොත් කීපයක්

## අරමුදල යටතේ 2012 වර්ෂය තුල ඉටු කරන ලද
## විශේෂිත සංවර්ධන කාර්යයන් පිළිබඳ සාරාංශය

| කාර්යය | වියදම (රු) |
|---|---|
| 1. උද්භිද උද්‍යාන පහසුකම් වැඩි දියුණු කිරිම, උද්‍යාන අලංකරණ කටයුතු | 10,629,239.00 |
| 2. උද්භිද උද්‍යානවල ඉඩම් සංවර්ධන කටයුතු | 44,246,333.00 |
| 3. උද්භිද උද්‍යානවල ගොඩනැගිලි සංවර්ධන කටයුතු | 12,237,357.00 |
| 4. පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම | 2,513,377.00 |
| 5. පර්යේෂණ හා පුහුණු කටයුතු හා පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා | 1,500,000.00 |
| එකතුව | 71,126,306.00 |

ආචාර්ය විලී ගමගේ
සභාපති, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ
ලේකම්, උද්භිද උද්‍යාන සහ පොදු
විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය.

ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර
ලේකම්, උද්භිද උද්‍යාන භාර සහ අරමුදල
අධ්‍යක්ෂ ජනරාල් ,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.